**පරිච්ඡේදය 08**

## 1.1. ඉඩම් භාවිතය

ශ්‍රී ලංකාවේ භූමි සම්පත වර්තමානය වන විට බහුවිධ කාර්යයන් සඳහා භාවිතා කර තිබේ. ජන සංඛ්‍යා වර්ධනයත්, යටිතල පහසුකම් පුළුල් වීමත් සමග ක්‍රම ක්‍රමයෙන් රටෙහි භූමිය සීමිත සම්පතක් බවට පත්වෙමින් පවතී. එපමණක් නොව සැලසුමකින් තොරව භූමිය භාවිතා කිරීම විවිධ ගැටලු ඇති කිරීමට හේතු වන අතර නොයෙක් ප්‍රදේශවල පාරිසරික මෙන්ම සමාජ හා ආර්ථික ගැටලු තත්ත්වයන් ද දැනටමත් උද්ගතව ඇත. එබැවින් නියමිත සැලසුමකට අනුව භූමිය භාවිතා කිරීම තුළින් සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ සංරක්ෂණය කිරීමටත් දැනට භාවිතා නොකර ඇති ඉඩම් සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමටත්, ඌන ලෙස පරිහරණය කර ඇති ප්‍රදේශ වැඩි දියුණු කිරීමටත් අව භාවිතයන් නිවැරදි කිරීමටත් පියවර ගැනීම ඉතා වැදගත් මෙන්ම කාලීන අවශ්‍යතාවය කි.

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්. 1,085ක් විවිධ වගාවන් සඳහා යොදාගෙන ඇති අතර, ඉතිරි හෙක්. 3,711 ක බිම් ප්‍රමාණය ගෙවතු, ගොඩනැගිලි සහිත බිම්, වගුරු බිම්, ලඳු කැළෑ සහ ජල තල සඳහා වෙන්ව ඇත. වගාවන් සඳහා යොදාගෙන ඇති බිම්වලින් වැඩි ප්‍රමාණයක කුරුඳු හා වී වගාව ව්‍යාප්තවී ඇත. ඉතිරි ඉඩම් ප්‍රමාණය පොල් හා අනෙක් බෝග වගාවන් සඳහා යොදා ගෙන ඇති අතර මෙම කොට්ඨාසයේ ඉඩම් හා භූමි පරිහරණය පහත සිතියම් මගින් ඉදිරිපත් කර ඇත.

මෙම කොට්ඨාසයේ දැනටමත් සංරක්ෂණය කර ඇති බිම් ප්‍රමාණය හෙක්. 938 ක් වේ. මෙම බිම් ප්‍රමාණය කොට්ඨාසයේ මුළු බිම් ප්‍රමාණයෙන් 16.8% ක් වේ. මින් වැඩි ප්‍රමාණයක් ජලතල වශයෙන් හඳුනා ගත හැකි අතර මාදු ගඟ, රන්දොඹේ ජලාශය, දූවේමෝදර ගඟ හා ඇළ මාර්ග මීට අයත් වේ. සියලු ගංගාවන් ගලා බසින ගංගාවන් ලෙස නොව විශාල ජලාශ හෝ කලපු ලෙස දක්නට ලැබේ.


ඉඩම් පරිහරණ සැලැස්ම- 2022
බලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය
සුචිකය
ආරක්ෂිත/සංරක්ෂිත ප්‍රදේශ
දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ
ආරක්ෂා කිරීම/ සංරක්ෂණය කිරීම සඳහා යෝජනා කරනු ලබන ප්‍රදේශ
සංවර්ධන කටයුතු සඳහා සුදුසු ප්‍රදේශ හා භූමි කළමනාකරණය වැඩි දියුණු කළ යුතු ප්‍රදේශ/ස්ථාන
විවිධ සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය ප්‍රදේශ
දැනට පවතින පරිහරණය අනිවාර්යයෙන්ම වෙනස් කල යුතු ප්‍රදේශ
දැනට පවතින භාවිතයන් ඒ ආකාරයෙන්ම ඉදිරියට පවත්වාගෙන යා යුතු ප්‍රදේශ
දැනට පවතින කෘෂිකාර්මික භාවිතය වෙනස් නොකල යුතු ප්‍රදේශ
දැනට පවතින නේවාසික ප්‍රදේශ
ස්වභාවික සම්පත් කැනීම් කල හැකි ස්ථාන
ඛනිජ කැනීම් සඳහා හඳුනාගෙන ඇති ස්ථාන
නාගරික කලාප
ප්‍රකාශයට පත් කර ඇති නාගරික ප්‍රදේශ
ජලතල
ග්‍රා.නි.ව.මායිම
ගංගා/ඇළ මාර්ග
ප්‍රධාන මාර්ග
දුම්රිය මාර්ග
115000
118000
121000
131000
128000
125000
122000
119000
116000
පැලැස්සපළාත
වතුරේවෙල
මහපිටිය
කළුවිල
පොල්අතුපළාත
කොස්ගොඩ
ඉන්දුරුව
මහලඳුව
බලපිටිය
රන්දොම්බේ


සිතියම 8.1




සිතියම 8.2

## 1.2. කෘෂි කර්මාන්තය

ශ්‍රී ලංකාව කෘෂි කාර්මික රටකි. ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් කෘෂි කාර්මික කටයුතුවල නියැලී සිටිති. අතීතයේ අප රට ස්වයංපෝෂිත රටක් වුවද වර්තමානය වන විට අත්‍යවශ්‍ය පරිභෝජන භාණ්ඩ සියල්ලම ආනයනය කිරීමට සිදුව ඇත. වර්තමාන රජයේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිය වී ඇත්තේ වසවිසෙන් තොර රටක් යන්නයි. මේ යටතේ වසවිසෙන් තොර ස්වයංපෝෂිත ආර්ථිකයක් ඇති කිරීම සඳහා "වී" වගාව සහ අතිරේක ආහාර බෝග වගාවට ප්‍රමුඛතාවයක් ලබා දෙයි. මේ සඳහා රජය විසින් ව්‍යාප්ත සේවා, බීජ, පොහොර සහනාධාර ආදිය ගොවීන්ට ලබා දීමෙන් ගොවි ජනතාව නිරන්තරව ධෛර්යමත් කරයි.

### 1.2.1. " වී " වගාව

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1995 වන විට 46% පමණ වූ ගොවිතැන් කටයුතු 2025 වන විට සැලකිය යුතු ප්‍රමාණයක් දක්වා අස්වැන්න පහත වැටී ඇත. වර්ෂයෙන් වර්ෂය ගොවීන්ට මුහුණ පෑමට සිදු වූ ගැටළු හේතුවෙන් (පහත් බිම් වතුරෙන් යටවීම, කුඹුරු බිම්වලට මුහුදු ජලය එක්වීම, අස්වැන්න අඩුවීම, පිරිවැය ඉහළ යාම, වාරි මාර්ග ගැටළු හා තරුණ ප්‍රජාව ගොවිතැනින් ඈත් වීම) ගොවීන් ගොවිතැනින් ඈත්ව වෙනත් විකල්ප රැකියා සොයා යන්නට විය. තරුණ පරම්පරාව වෙනත් රැකියාවන්ට යොමු වීම වැනි ගැටළු නිසා කුඹුරු වගාව පිළිබඳ අවධානය ගිලිහෙමින් පවතී. කුඹුරු වගා කිරිමේ වැදගත්කම පිළිබඳව තරුණ පරම්පරාව දැනුවත් කිරීම තුළින් මේ කෙරෙහි නැඹුරුතාවය වැඩි කල හැකි ය. වෙළඳපොළේ පවතින සහල් සඳහා බහුල වශයෙන් පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය යොදා ඇති බවත් ඒවා පරිභෝජනය කිරීමට වඩා තමන් විසින්ම වගා කරන ලද සහල් පරිභෝජනය කිරීම සෞඛ්‍යට හිතකර වන බවත් සඳහන් කරමින් ගොවීන් දැනුවත් කර ඔවුන්ගේ ආකල්ප වෙනස් කර ගොවිතැනට යොමු කිරීමට උත්සාහ ගත යුතු ය.

තවද වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇළ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සහ ජල පාලන දොරටු සවිකිරීම ආදිය සිදුකල ද ඉන් පසු ඒවායේ නඩත්තු කටයුතු සිදුකිරීම පිළිබඳව ගොවි ජනතාවගේ අවධානය ගිලිහී ගොස් ඇත. එබැවින් එහි ඇති වැදගත්කම පිළිබඳව ගොවීන් දැනුවත් කර ගොවි සංවිධාන හරහා හෝ මේ සඳහා නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

බටහිර මායිම සම්පූර්ණයෙන්ම මහ සයුරට මායිම්ව පවතින බළපිටිය කොට්ඨාසයේ මුහුදු ජලය ගහන කලාපයක් වන බැවින් වී වගාව සඳහා එතරම් සාර්ථකත්වයක් නොදැක්වුවත් ඕනෑම අභියෝගයක් ජය ගැනීමට සමත් බළපිටිය ජනතාව වී වගාව සඳහා ද යම් ප්‍රගතියක් දක්වා ඇත. කොස්ගොඩ සහ අහුන්ගල්ල කලාපයට අයත් ග්‍රාම නිලධාරි වසම් කිහිපයක 2024/2025 වර්ෂයන්ට යල - මහ කන්න දෙකේ දී "වී" වගා කල ආකාරය හා එම වර්ෂයන් සඳහා ලද අස්වැන්න පහත සංඛ්‍යා සටහන මගින් දක්වා ඇත.

ජාතික අවශ්‍යතා ද සැලකිල්ලට ගනිමින් දේශිය ආහාර අවශ්‍යතා තහවුරු කිරීමටත්, උසස් ජීවන තත්ත්වය, සමානාත්මතාවය, පාරිසරික තිරසාරත්වය යන සාධක සැලකිල්ලට ගනිමින් මෙම කොට්ඨාසයේ කෘෂි කාර්මික කටයුතු සිදු කරනු ලබයි. කෘෂි කර්මාන්තය පිළිබඳව සලකා බැලිමේදී

බලපිටිය කොට්ඨාසයේ ද කුරුඳු වගාව, වී වගාව, ඉන්නල වගාව, පොල් වගාව සමග සුළු වශයෙන් හෝ  අනෙකුත් හෝග වගාවන් ද සිදු කරනු දක්නට ලැබේ.

“වී” වගාව බහුල වශයෙන් සිදු කල ග්‍රාම නිලධාරී වසම් පහත දැක්වේ.

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | 2025 යල කන්නය (අක්කර) | 2024/2025 මහ කන්නය (අක්කර) | මුළු කුඹුරු ප්‍රමාණය (අක්කර) | මුළු අස්වැන්න (කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | 22.01 | 13.01 | 35.02 | 61,747 |
| 2 | 16 ඒ | පැළැගස්පළාත | 32 | 21 | 53 | 33.15 |
| 3 | 16 බී | වතුරවෙල | 28 | 20.5 | 48.5 | 2,700 |
| 4 | 16 සී | බොරළුකැටිය | 58 | 39.5 | 97.5 | 4,730 |
| 5 | 16 ඩී | නානතොටපළාත | 137 | 0.1 | 137.1 | 50,456 |
| 6 | 17 බී | මහපිටිය | 60 | 95.1 | 160 | 85,000 |
| 7 | 17 සී | කුඩාගොඩගම | 5 | 7.01 | 123 | 17,100 |
| 8 | 24 ඒ | පොල් අතු පළාත | 23 | 22 | 45 | 16,822 |
| 9 | 24 බී | කටුවිල | 33.25 | 26.75 | 60 | 17,969 |
| 10 | 24 ඩී | පතිරාජපෙදෙස | 46.5 | 40 | 72 | 4,357 |
| එකතුව | | | **444.76** | **284.97** | **831.12** | **260,914** |

සංඛ්‍යා සටහන 8.1

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

### 1.2.2. අතුරු බෝග වගාව 2024/2025 මහ කන්නය (කුඹුරු ඉඩම්වල)

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | බෝග වර්ගය | වී වගා කරන කාලය තුල වගාව | | වී වගා කන්න 02ක් අතරතුර වගා කිරීම | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය (අක්කර) | අස්වනු ප්‍රමාණය (කි.ග්‍රෑම්) | ප්‍රමාණය (අක්කර) | අස්වනු ප්‍රමාණය (කි.ග්‍රෑම්) |
| 1 | 15 | දූවේමෝදර | ඉන්නල | 10.5 | 41,000 | - | - |
| 2 | 16 ඩී | නානතොටපළාත | ඉන්නල | 6 | 25,000 | - | - |
| 3 | 17 බී | මහපිටිය | ඉන්නල | 5 | 21,000 | - | - |
| **එකතුව** | | | 0 | 21.5 | 87,000 | 0 | 0 |

සංඛ්‍යා සටහන 8.2

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

## 1.2.3. පුරන් කුඹුරු බිම් ප්‍රමාණය

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | යායේ නම | පුරන් කුඹුරු බිම් ප්‍රමාණය (අක්කර) | පුරන්වීමට හේතුව | එය මගහරවා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | වැව ඉහළ සහ වැව පහළ | 5 | ප්‍රවේශ මාර්ගයකට අධිකරණ නඩුවක් හා මාර්ග ප්‍රවේශ නොමැති වීම | නීතිමය පියවර |
| 2 | 16 | නාපේ | නාපේ වෙල | 10 | වියදම් අධික වීම | |
| 3 | 16 සී | බොරළුකැටිය | පුවක්ගහ බොක්ක යාය | 4 | පස සෝදාවිත් ගොඩවීම | ඇල කැපීම |
| | | | කැකිල්ලවල යාය | 6 | පස සෝදාවිත් ගොඩවීම | ඇල කැපීම |
| | | | බොරලුකැටිය යාය | 18 | හැල් සහිත වීම/ගොවීන් පිට පදිංචි වීම/වියදම් අධික වීම | මූලික බිම් සකස්කර දීම |
| | | | කකුස්සි උඩුමුල්ල ය | 1.5 | වියදම් අධික වීම/සත්ව හානි | මූලික බිම් සකස්කර දීම/විදුලි වැට |
| | | | නරවකන්ද යාය | 0.25 | පස සෝදාවිත් ගොඩවීම | වෙනත් වගාව සඳහා යොමු කර ඇත |
| | | | අඹගහ යාය | 2 | වියදම් අධික වීම | මූලික බිම් සකස් කර දීම |
| | | | කඩවල යාය | 4.25 | වියදම් අධික වීම/වැලි ඉවත් කිරිම | මූලික බිම් සකස්කර දීම/වෙනත් වගාවක් සඳහා යොමු කර ඇත |
| | | | කොලනිය යාය | 5 | පිට පදිංචි වීම | වෙනත් වගාවක් සඳහා යොමු කර ඇත |
| 4 | 16 ඩී | නානතොටපලාත | ගල් ඇලඉහල | 4.5 | වනසතුන්ගේ හානි | විදුලි වැට |
| | | | ගල්ගෙඩියාය | 2.5 | ප්‍රදේශයේ පදිංචි නොවේ/මාර්ග අපහසුතා | - |
| 5 | 17 | හැගල්ල පියගම | කරජ්ජ පිටිය | 57 | කරදිය ගැලීම | කරදිය වීම වැළැක්වීම |
| 6 | 17 බී | මහපිටිය | ගිනිගල්මානාන/ඕකන්ද | 16 | පෞද්ගලික හේතු | නීතිමය පියවර |
| 7 | 17 සී | කුඩාගොඩගම | කරිජ්ජපිටිය යාය | 113 | කරදිය ගැලීම හා කාලයක් වගා නොකිරිම | කරදිය වැලැක්වීම |
| 8 | 17 ඩී | ගොඩපිටිය | කරිජ්ජපිටිය යාය | 1.5 | කරදිය ගලා ඒම | - |
| 9 | 24 | ගල්වෙහෙර | කරජ්ජපිටිය යාය | 19.76 | කරදිය ගලා ඒම | දැනට පොල් වගා කිරීම සඳහා ඉල්ලුම්පත් ලබා දී ඇත. |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | යායේ නම | පුරන් කුඹුරු බිම් ප්‍රමාණය (අක්කර) | පුරන්වීමට හේතුව | එය මගහරවා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|
| 10 | 24 ඒ | පොල්අතුපලාත | හොරඬුවයාය, කන්දෙවෙලයාය, කන්දෙවෙල පහලයාය, ගලගාව උඩුමුල්ලයාය, ලාළුඑගහ උඩුමුල්ලයාය, මලකුනාවයාය | 79.5 | හැල් සහිත වීම කරදිය සහිත වීම මුදල් නොමැතිකම | අවම පිරිවැයක් යටතේ වල්නාශක, බිත්තර වී ලබා දීම |
| 11 | 24 ඩී | පතිරාජපෙදෙස | කජුගහගොවිපල යාය | 5.2 | ජලය ලබාගැනීමට නොහැකි වීම | කුඹුර ඉඩම කොටස් කරඇත |
| 12 | 24 ඊ | පතිරාජගම | පොත්තවෙලයාය, ඕලුබොක්කයාය | 20.8 | ඇළ ප්‍රතිසංස්කරණය නොකිරීම | ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත |
| එකතුව | | | | **375.76** | | |

සංඛ්‍යා සටහන 8.3

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

## 1.3. “ කුරුඳු ” වගාව

මිනිසා විසින් අතිතයේදි හඳුනා ගන්නා ලද කුළුබඩු බෝගයක් වන කුරුඳු ශාකය ලෝරේසියේ කුලයට සහ සිනමෝමම් සනයට අයත් ශ්‍රී ලංකාවට ආවේනික බෝගයකි. කුරුඳු පොතු ගලවා කුරුඳු කූරු ලෙස සකසා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකාවටම ආවේණික ක්‍රමවේදයක් වන අතර මෙම සැකසීම ශ්‍රී ලංකාවේ කුරුඳුවල අනන්‍යතාවය ආරක්ෂා කිරීමට හේතුවක්වී ඇත. කුරුඳු ශාකය සදාහරිත බහු වාර්ෂික බෝගයක් වන අතර ඍජුව වැඩුණ මනාව අතු බෙදුණු දුඹුරු පැහැති කඳන් ඇති ශක්තිමත් මුල් පද්ධතියක් සහිත ශාකයකි. කුරුඳු පත්‍ර එකිනෙකට ප්‍රතිවිරුද්ධ ලෙස සර්පිලාකාරව පිහිටන අතර පත්‍ර පාදයේ සිට අග්‍රය දක්වා විහිදෙන පැහැදිලි නාරටි තුනක් දක්නට ඇත. කුරුඳු නිවර්තන කලාපීය ශාකය කි. එය පුළුල් පරාසයක් සහිත දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන අතර විවිධ පාංශු තත්ත්වයන් යටතේ මනාව වගා කළ හැකි ය. දකුණු පලාතේ ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල මෙම බෝගය මනාව වගා කල හැක.

කුරුඳු බහුලව වගා කරන පස්වල භෞතික ලක්ෂණ එම වගාවට එතරම් සීමාකාරි සාධකය නොවුවත් සෝදාපාළුවට ලක්වූ මීටර් එකකට වඩා අඩු පාංශු ගැඹුරක් ඇති ගල් සහිත, අධික බෑවුම් ඉඩම් කුරුඳු වගාවට යෝග්‍ය නොවේ. පාංශු PH අගය 5.5 – 6.5 දක්වා පරාසය තුළ වගාවට ඉතා යෝග්‍ය වේ. වාර්ෂික වර්ෂාපතනය මි.මි. 1,875 සිට 3,750 ද, උෂ්ණත්ව පරාසය සෙල්සියස් අංශක 25 – 30 අතර පැවතීම මෙම වගාව සඳහා උචිත දේශගුණික සාධක ලෙස හඳුන්වා දිය හැකි ය.

වෙළඳපොළේදී කුරුඳුවල ගුණාත්මකභාවය තීරණය කරන ප්‍රධාන සාධක ලෙස භෞතික පෙනුම, තෙතමන ප්‍රතිශතය, අඩංගු වාෂ්පශීලි තෙල් ප්‍රමාණය, රසය, වර්ණය, රසායනික සංඝටක, අපද්‍රව්‍ය අවශේෂ ප්‍රමාණය සලකා බැලේ. කුරුඳු වගාව සම්බන්ධයෙන් ද පවතින ප්‍රධාන ගැටලුවක් ලෙස කුරුඳු වගාකරුවන් හට කුරුඳු තලා ගැනීම සඳහා තැරැව්කරුවන් හට වැඩි මුදලක් ගෙවීමට සිදුවීම දැක්විය හැකි ය. කුරුඳු තලන ලද ආදායමින් 1/3 ක් හෝ 1/2 ක් තැරැවුකරුවන්ට ගෙවීමට සිදු වේ. මේ හේතුව නිසාවෙන් කුරුඳු තැලීම පිළිබඳව වගාකරුවන්ට පුහුණුව ලබාදීම අවශ්‍ය වේ. ගුණත්වයෙන් ඉහළ කුරුඳු සඳහා අපනයන විභවතාවයක් පවතින අතර ඉඩම් හිමියන්ව කුරුඳු වගාව කෙරෙහි යොමු කරවීම වැදගත් වේ.

### 1.3.1. කුරුඳු පැල තවාන්කරුවන්

| අනු අංකය | තවාන්කරුගේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| 1 | ටී.කිංස්ලි ප්‍රභාත් මෙන්ඩිස් | පොල්වත්ත පාර, දූවේමෝදර, කොස්ගොඩ | 77 7341888 |
| 2 | එම්.අනෝජා ද සිල්වා | මුහුදු පෙදෙස, වතුරේගම, අහුන්ගල්ල | 74 2170452 |

දත්ත සටහන 8.1

මූලාශ්‍රය: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, කරන්දෙණිය

## 1.4. ගෙවතු වගාව

එළවළු වගාවේ නිසියාකාර අස්වැන්නක් ලැබීමට නම් අනිවාර්යෙන්ම පොහොර යෙදීමක් සිදු කල යුතු ය. මෙහිදී පොහොර යෙදීම හේතුවෙන් පසෙහි ස්වභාවික ක්‍රියාවලියට බාධා පැමිණෙන බැවින් රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර යෙදීම කෙරෙහි ගොවියා උනන්දු කල යුතු කාලය එළඹ ඇත. ගෙවතු වගාවන් සිදුකරන ගොවීන් බොහෝ දුරට අස්වැන්න නෙලීමෙන් පසුව නැවත වගා කිරීමට යොමුවීමේ ප්‍රවණතාවය අඩු වේ. නියඟය, ගං වතුර, පළිබෝධ හානි හෝ සත්ත්ව හානි වැනි හානි සිදුවීමෙන් අනතුරුව ද අස්වැන්න නෙලීමෙන් අනතුරුව ද නැවත ගෙවතු වගා කිරීමට ගොවීන් මැලිකමක් දක්වයි. එමනිසා ගොවීන් දැනුවත් කිරීම හා ගෙවතු වගා පුහුණු වැඩසටහන් පැවැත්වීම ද වැදගත් වේ. වැඩිදියුණු කරන ලද බීජ වර්ග ලබා දීම, පොහොර සහනාධාරය ලබාදීම හා නවීන ක්‍රම හඳුන්වා දීම මඟින් බළපිටිය ප්‍රදේශයේ ගෙවතු වගාව තව තවත් දියුණු කල හැකිය. එමෙන්ම පවුලට සරිලන ආහාර අවශ්‍යතාවය තම ගෙවත්තෙන් ම සපයා ගැනීමෙන් ශරීර සෞඛ්‍යට හිතකර ආහාර වේලක් ලබා ගැනිමට හැකි වීම මගින් නීරෝගිමත් පරපුරක් ගොඩනැගෙන බවටත් ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් ගෙවතු වගාව තවත් ඉහළට නංවාලිය හැකිය.

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | වගාවන්ට යොමු වූ ගෙවතු ගණන | තවදුරටත් සංවර්ධනය කල හැකි ගෙවතු ගණන | ගෙවතු වගාවේ ගැටලු හා ඒවා විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | 260 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 2 | 16 | නාපේ | 20 | 20 | වඳුරන්ගෙන් වන හානි |
| 3 | 16 ඒ | පැලැගස් පළාත | 30 | 10 | වන සතුන් ගෙන් හානි මර්දනයට ක්‍රමවේදයක් ජලය සම්පාදනය අපහසු වෙයි |
| 4 | 16 බී | වතුරවෙල | 28 | 14 | වන සතුන්ගෙන් වන හානි |
| 5 | 16 සී | බොරළුකැටිය | 35 | 17 | වන සතුන්ගෙන් වන හානි |
| 6 | 16 ඩී | නානතොටපලාත | 50 | 10 | වන සතුන් ගෙන් හානි මර්දනයට ක්‍රවේදයක් ජලය හිඟය |
| 7 | 17 | හැගල්ල පියගම | 150 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 8 | 17 ඒ | කොස්ගොඩ | 15 | 20 | කෘෂි උපකරණ ලබාදීම. |
| 9 | 17 බී | මහපිටිය | 100 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 10 | 19 | වැල්ලබඩ | 18 | 15 | වඳුරන්ගෙන් වන හානි |
| 11 | 19 ඒ | වතුරෙගම | 40 | 5 | මොණරන් සහ වඳුරන්ගෙන් වන හානි. |
| 12 | 19 බී | මාකුඹුර | 30 | 5 | මොණරන් සහ වඳුරන්ගෙන් වන හානි. |
| 13 | 19 සී | කදිරගොන්න | 30 | 5 | මොණරන් සහ වඳුරන්ගෙන් වන හානි. |
| 14 | 20 | බ්‍රාහ්මණවත්ත උතුර | 37 | 5 | මොනරුන් හා වඳුරන්ගෙන් වර්ෂාවෙන්. |
| 15 | 20 ඒ | පාතෙගම්ගොඩ | 18 | 12 | වඳුරන්ගෙන් වන හානි |
| 16 | 20 බී | බ්‍රාහ්මණවත්ත දකුණ | 28 | 5 | මොනරුන් හා වඳුරන්ගෙන් වර්ෂාව සමඟ ජලය බැස නොයෑම |
| 17 | 21 | ගල්මංගොඩ | 10 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 18 | 21 ඒ | වැලිවතුගොඩ | 21 | 12 | වඳුරන්ගෙන් වන හානි |
| 19 | 21 බී | හීනටිය උතුර | 30 | 15 | වඳුරන්ගෙන් වන හානි |
| 20 | 21 සී | හීනටිය දකුණ | 35 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 21 | 21 ඩී | මහලදූව | 25 | 15 | වඳුරන්ගෙන් වන හානි |
| 22 | 21 ඊ | ඇලතොට | 5 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 23 | 24 | ගල්වෙහෙර | 35 | 10 | මොණරන් සහ වඳුරන්ගෙන් වන හානි |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | වගාවන්ට යොමු වූ ගෙවතු ගණන | තවදුරටත් සංවර්ධනය කල හැකි ගෙවතු ගණන | ගෙවතු වගාවේ ගැටලු හා ඒවා විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| 24 | 24 ඒ | පොල්අතුපලාත | 30 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 25 | 24 බී | කටුවිල | 20 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 26 | 24 සී | බෝගහපිටිය | 20 | 10 | කෘෂි හානි |
| 27 | 24 ඩී | පතිරාජපෙදෙස | 20 | 10 | කෘෂි හානි |
| 28 | 24 ඊ | පතිරාජගම | 40 | 10 | මොණරන් සහ වඳුරන්ගෙන් වන හානි |
| 29 | 87 | පරගහතොට | 30 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 30 | 87 බී | ආඳාදොළ | 50 | 0 | වර්ෂා ජලයෙන් ගෙවතු යට වීම / කාණු පද්ධතිය පිළිසකර කිරිම |
| 31 | 87 සී | වතුගෙදර | 50 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 32 | 87 ඩී | සීනිගොඩ | 25 | 10 | වඳුරන්ගෙන් වන හානි |
| 33 | 87 ඊ | වඩුමුල්ල | 30 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 34 | 87 එෆ් | කුරුඳුවත්ත | 30 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 35 | 87 ජී | විහාරගොඩ | 190 | 50 | වඳුරන්ගෙන් වන හානි |
| 36 | 87 එච් | පැටිවත්ත | 25 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 37 | 88 | රන්දොඹේ දකුණ | 250 | 70 | වඳුරන්ගෙන් වන හානි |
| 38 | 88 ඒ | කන්දෙගොඩ | 160 | 100 | වඳුරන්ගෙන් වන හානි |
| 39 | 88 බී | රන්දොඹේ උතුර | 150 | 50 | වඳුරන්ගෙන් වන හානි |
| 40 | 88 සී | බෝගහවත්ත | 30 | 50 | වඳුරන්ගෙන් වන හානි |
| 41 | 89 | බළපිටිය | 15 | 10 | බීජවර්ග ලබාදීම |
| 42 | 89 ඒ | වලගෙදර | 39 | 6 | මොණරුන් හා මොණරුන් හා වඳුරන්ගෙන් වර්ෂාවෙන් |
| 43 | 89 බී | බේරතුඩුව | 15 | 10 | බීජ වර්ග ලබාදීම |
| 44 | 90 | වඳදූව | 20 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| 45 | 90 ඒ | මහකරාව | 50 | 0 | වඳුරන්ගෙන් වන හානි |
| **එකතුව** | | | **2,339** | **641** | |

සංඛ්‍යා සටහන 8.4

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

## 1.5. ආර්ථික බෝග වගාව (පුද්ගල අයිතිය) (අක්කරවලින්)

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | තේ | රබර් | පොල් | කටුපොල් | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | 0 | 0 | 46.5 | 0 | 0 |
| 2 | 16 | නාපේ | 0 | 0 | 108 | 0 | 0 |
| 3 | 16 ඒ | පැලැගස්පලාත | 0 | 0 | 16 | 0 | 0 |
| 4 | 16 බී | වතුරවෙල | 0 | 0 | 4 | 0 | 0 |
| 5 | 16 සී | බොරළුකැටිය | 1 | 12.75 | 17 | 0 | 0 |
| 6 | 16 ඩී | නානතොටපලාත | 0 | 5 | 5.5 | 0 | 0 |
| 7 | 17 | හැගල්ල පියගම | 0 | 0 | 20 | 0 | 0 |
| 8 | 17 ඒ | කොස්ගොඩ | 0 | 0 | 24 | 0 | 0 |
| 9 | 17 බී | මහපිටිය | 0 | 0 | 15 | 0 | 0 |
| 10 | 17 සී | කුඩාගොඩගම | 0 | 0 | 58 | 0 | 0 |
| 11 | 17 ඩී | ගොඩපිටිය | 0 | 0 | 15 | 0 | 0 |
| 12 | 18 | අහුන්ගල්ල | 0 | 0 | 8 | 0 | 0 |
| 13 | 18 ඒ | මීද්දරමුල්ල | 0 | 0 | 67 | 0 | 0 |
| 14 | 19 | වැල්ලබඩ | 0 | 0 | 27 | 0 | 0 |
| 15 | 19 ඒ | වතුරෙගම | 0 | 0 | 18 | 0 | 0 |
| 16 | 19 බී | මාකුඹුර | 0 | 0 | 11 | 0 | 0 |
| 17 | 19 සී | කදිරගොන්න | 0 | 0 | 12 | 0 | 0 |
| 18 | 20 | බ්‍රාහ්මණවත්ත උතුර | 0 | 0 | 28 | 0 | 0 |
| 19 | 20 ඒ | පාතෙගම්ගොඩ | 0 | 0 | 14.1 | 0 | 0 |
| 20 | 20 බී | බ්‍රාහ්මණවත්ත දකුණ | 0 | 0 | 26 | 0 | 0 |
| 21 | 21 | ගල්මංගොඩ | 0 | 0 | 5 | 0 | 0 |
| 22 | 21 ඒ | වැලිවතුගොඩ | 0 | 0 | 17 | 0 | 0 |
| 23 | 21 බී | හීනටිය උතුර | 0 | 0 | 1 | 0 | 0 |
| 24 | 21 සී | හීනටිය දකුණ | 0 | 0 | 1 | 0 | 0 |
| 25 | 21 ඩී | මහලදූව | 0 | 0 | 0.5 | 0 | 0 |
| 26 | 21 ඊ | ඇලතොට | 0 | 0 | 1 | 0 | 0 |
| 27 | 22 | වැලිතර | 0 | 0 | 2 | 0 | 0 |
| 28 | 24 | ගල්වෙහෙර | 0 | 0 | 7 | 0 | 0 |
| 29 | 24 බී | කටුවිල | 0 | 0 | 18 | 0 | 0 |
| 30 | 24 සී | බෝගහපිටිය | 0 | 0 | 13 | 0 | 0 |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | තේ | රබර් | පොල් | කටුපොල් | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 31 | 24 ඞී | පතිරාජපෙදෙස | 0 | 0 | 27 | 0 | 0 |
| 32 | 24 ඊ | පතිරාජගම | 0 | 0 | 7 | 0 | 0 |
| 33 | 87 ඒ | වතුගෙදර දකුණ | 0 | 0 | 2 | 0 | 0 |
| 34 | 87 සී | වතුගෙදර | 0 | 0 | 9 | 0 | 0 |
| 35 | 87 ජී | විහාරගොඩ | 0 | 0 | 18 | 0 | 0 |
| 36 | 88 | රන්දොඹේ දකුණ | 0 | 0 | 27 | 0 | 0 |
| 37 | 88 ඒ | කන්දෙගොඩ | 0 | 0 | 28 | 0 | 0 |
| 38 | 88 බී | රන්දොඹේ උතුර | 0 | 0 | 22 | 0 | 0 |
| 39 | 88 සී | බෝගහවත්ත | 0 | 0 | 10 | 0 | 0 |
| 40 | 89 | බළපිටිය | 0 | 0 | 20 | 0 | 0 |
| 41 | 89 ඒ | වලගෙදර | 0 | 0 | 25 | 0 | 0 |
| 42 | 89 බී | බෙරතුඩුව | 0 | 0 | 8 | 0 | 0 |
| 43 | 90 | වඳුදූව | 0 | 0 | 0.5 | 0 | 0 |
| 44 | 90 ඒ | මහකරාව | 0 | 0 | 0.5 | 0 | 0 |
| **එකතුව** | | | **1** | **17.75** | **809.6** | **0** | **0** |

සංඛ්‍යා සටහන 8.5

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

## 1.6. සුළු අපනයන බෝග වගාව (අක්කරවලින්)

සුළු අපනයන භෝග ලෙස කුරුඳු, කෝපි, ගම්මිරිස්, පොල්, කහ,ඉඟුරු හා තේ වගාවන් සිදු කරන අතර ලැබෙන ඵලදාව සම්බන්ධයෙන් ගොවීන් තුළ ඇත්තේ සෘණ ආකල්පයකි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | කුරුඳු | ගම්මිරිස් | තේ | පොල් | කෝපි | කහ | ඉඟුරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | 208 | 2.2 | | 46.5 | 0.25 | 0.5 | 0.25 |
| 2 | 16 | නාපේ | 42 | 1.25 | | 108 | 0.25 | 0.5 | 0.25 |
| 4 | 16 බී | වතුරවෙල | 217 | 1 | 0 | 16 | 0 | 1 | 0.25 |
| 5 | 16 සී | බොරලුකැටිය | 805.75 | 2.125 | 0 | 27 | 0 | 2 | 0.5 |
| 7 | 17 | හැගල්ල පියගම | 12 | 2 | 0 | 30 | 0 | 0 | 0 |
| 8 | 17 ඒ | කොස්ගොඩ | 0 | 0.25 | 0 | 20 | 0 | 0.5 | 0.25 |
| 9 | 17 බී | මහපිටිය | 20 | 0 | 0 | 19 | 0 | 0 | 0 |
| 10 | 17 සී | කුඩාගොඩගම | 112 | 0 | 0 | 58 | 0 | 0.25 | 0 |
| 12 | 18 | අහුන්ගල්ල | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | කුරුඳු | ගම්මිරිස් | තේ | පොල් | කෝපි | කහ | ඉඟුරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | 18 ඒ | මිද්දරමුල්ල | 9.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 14 | 19 | වැල්ලබඩ | 2 | 0.125 | 0 | 27 | 0.031 | 0.012 | 0.025 |
| 18 | 20 | බ්‍රාහ්මණවත්ත උතුර | 0 | 1 | 0 | 36 | 0 | 0.5 | 0.5 |
| 19 | 20 ඒ | පාතෙගම්ගොඩ | 13.01 | 0.25 | 0 | 14.25 | 0.13 | 0.09 | 0.09 |
| 20 | 20 බී | බ්‍රාහ්මණවත්ත දකුණ | 0 | 1.2 | 0 | 36 | 0 | 0.5 | 0.5 |
| 21 | 21 | ගල්මංගොඩ | 5 | 0 | 0 | 4 | 0 | 0 | 0 |
| 22 | 21 ඒ | වැලිවතුගොඩ | 17 | 0.11 | 0 | 17 | 0.11 | 0.10 | 0.06 |
| 23 | 21 බී | හීනටිය උතුර | 3 | 0.09 | 0 | 0 | 0 | 0.09 | 0.09 |
| 24 | 21 සී | හීනටිය දකුණ | 45 | 0.06 | 0 | 0 | 0 | 0.06 | 0.06 |
| 25 | 21 ඩී | මහලදූව | 25 | 0.03 | 0 | 0 | 0 | 0.25 | 0.06 |
| 26 | 21 ඊ | ඇලතොට | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 27 | 22 | වැලිතර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 28 | 23 | මාදූව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 29 | 24 | ගල්වෙහෙර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 30 | 24 ඒ | පොල්අතුපලාත | 236 | 1 | 0 | 5 | 0 | 1 | 0.75 |
| 31 | 24 බී | කටුවිල | 0 | 2 | 0 | 18 | 0 | 1 | 0.25 |
| 32 | 24 සී | බෝගහපිටිය | 31 | 0.2 | 0 | 13 | 0 | 0 | 0 |
| 33 | 24 ඩී | පතිරාජපෙදෙස | 227 | 3.25 | 0 | 27 | 0 | 0 | 0 |
| 34 | 24 ඊ | පතිරාජගම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 35 | 87 | පරගහතොට | 0 | 0 | 0 | 7 | 0 | 0 | 0 |
| 36 | 87 ඒ | වතුගෙදර දකුණ | 0.5 | 0.25 | 0 | 2 | 0.01 | 0.06 | 0.03 |
| 37 | 87 බී | ආඳාදොළ | 12 | 0 | 0 | 9 | 0 | 0 | 0 |
| 38 | 87 සී | වතුගෙදර | 12.18 | 1 | 9 | 0 | 0.25 | 0.09 | 0.09 |
| 39 | 87 ඩී | සීනිගොඩ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 40 | 87 ඊ | වඩුමුල්ල | 0 | 0 | 0 | 7 | 0 | 0 | 0 |
| 41 | 87 එෆ් | කුරුඳුවත්ත | 0 | 0 | 0 | 10 | 0 | 0 | 0 |
| 42 | 87 ජී | විහාරගොඩ | 2.5 | 0 | 0 | 18.86 | 0.01 | 0.06 | 0.01 |
| 43 | 87 එච් | පැටිවත්ත | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 44 | 88 | රන්දොඹේ දකුණ | 3 | 0 | 0 | 27 | 0.01 | 0.12 | 0.01 |
| 45 | 88 ඒ | කන්දෙගොඩ | 5 | 0 | 0 | 28 | 0.02 | 0.12 | 0.03 |
| 46 | 88 බී | රන්දොඹේ උතුර | 3 | 0 | 0 | 22 | 0.01 | 0.06 | 0.01 |
| 47 | 88 සී | බෝගහවත්ත | 0.5 | 0 | 0 | 10 | 0.01 | 0.03 | 0.01 |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | කුරුඳු | ගම්මිරිස් | තේ | පොල් | කෝපි | කහ | ඉගුරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 48 | 89 | බළපිටිය | 1.5 | 0 | 0 | 20 | 0 | 0 | 0 |
| 49 | 89 ඒ | වලගෙදර | 0 | 2 | 0 | 36 | 0 | 1 | 1.5 |
| 50 | 89 බී | බේරතුඩුව | 2 | 0 | 0 | 8 | 0 | 0 | 0 |
| 51 | 90 | වඳුවූ | 12 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 52 | 90 ඒ | මහකරාව | 8 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | | | **2,098.44** | **21.39** | **9** | **726.61** | **1.086** | **9.892** | **5.575** |

සංඛ්‍යා සටහන

8.6

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ -

2025

## 1.6.1. ලියාපදිංචි පැල තවාන්කරුවන් (සුළු අපනයන බෝග)

| අනු අංකය | නම | ලිපිනය | දුරකථන අංකය | වගා කරනු ලබන බෝග වර්ගය සහ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | ටී.කිංස්ලි මෙන්ඩිස් | දූවේමෝදර, කොස්ගොඩ | 77 7341888 | ගම්මිරිස් - අක්කර 15<br>කහ - අක්කර 0.5 |
| 2 | ආර්.ඒ.පැතුම් තරංග | සීනිගොඩ, වතුගෙදර | 77 3978345 | ගම්මිරිස් - අක්කර 5<br>කහ - 0.5 |

දත්ත සටහන

8.2

මූලාශ්‍රය: අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, ගොවිජන සේවා මධ්‍යස්ථානය

## 1.7. එළවළු වගාව (අක්කරවලින්)

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | වම්බටු | බණ්ඩක්කා | මෑ කරල් | පතෝල | කරවිල | පලා වර්ග | මඤ්ඤොක්කා | ඉන්නල/ කිරි අල |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | 0.25 | 1 | 0.75 | 0.25 | 0.5 | 0.25 | 0.5 | 11 |
| 2 | 16 | නාපේ | 0.5 | 1 | 0.5 | 0.25 | 0.25 | 0.25 | 1 | 1 |
| 3 | 16 ඒ | පැලෑගස්පලාත | 0.25 | 0.25 | 0.19 | 0.21 | 0.09 | 1 | 1.5 | 0.3 |
| 4 | 16 බී | වතුරවෙල | 0.25 | 0.25 | 0.12 | 0 | 0 | 0 | 1.5 | 0.25 |
| 5 | 16 සී | බොරළුකැටිය | 1.5 | 2 | 0.19 | 0.5 | 0 | 0 | 3 | 0.5 |
| 6 | 16 ඩී | නානතොටපලාත | 3 | 2 | 2 | 1 | 0.5 | 0.5 | 3 | 7 |
| 7 | 17 | හැගල්ල පියගම | 0.25 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 8 | 17 ඒ | කොස්ගොඩ | 0.25 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 9 | 17 බී | මහපිටිය | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 10 | 17 සී | කුඩාගොඩගම | 0.5 | 2 | 0.5 | 0.25 | 0.25 | 0.25 | 0 | 4 |
| 11 | 19 ඒ | වතුරෙගම | 0.05 | 0.05 | 0.05 | 0.4 | 0.02 | 0.02 | 0.25 | 0 |
| 12 | 19 බී | මාකුඹුර | 5 | 6 | 4 | 0 | 2 | 5 | 12 | 0 |
| 13 | 19 සී | කදිරගොන්න | 5 | 7 | 5 | 0 | 2 | 5 | 10 | 0 |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | වම්බටු | බණ්ඩක්කා | මෑ කරල් | පතෝල | කරවිල | පලා වර්ග | මඤ්ඤොක්කා | ඉන්නල/ කිරි අල |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | 20 | බ්‍රාහ්මණවත්ත උතුර | 0.5 | 0.5 | 0.5 | 0.4 | 1 | 2 | 1 | 0 |
| 15 | 20 ඒ | පාතෙගම්ගොඩ | 0.01 | 0.03 | 0.04 | 0.06 | 0.09 | 0.06 | 0.25 | 0.03 |
| 16 | 20 බී | බ්‍රාහ්මණවත්ත දකුණ | 0.45 | 0.5 | 0.5 | 0.3 | 1 | 2 | 0.5 | 0 |
| 17 | 21 | ගල්මංගොඩ | 0.01 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 18 | 21 ඒ | වැලිවතුගොඩ | 0.03 | 0.04 | 0.03 | | 0.03 | 0.03 | 0.01 | 0.03 |
| 19 | 21 බී | හීනටිය උතුර | 0.03 | 0.03 | 0 | 0.03 | 0.01 | 0.19 | 0.16 | 0 |
| 20 | 21 සී | හීනටිය දකුණ | 0.03 | 0.03 | 0 | 0.03 | 0.03 | 0.16 | 0.03 | 0 |
| 21 | 24 | ගල්වෙහෙර | 0.0125 | 0.1 | 0.2 | 0 | 0.0125 | 0.1 | 0 | 0 |
| 22 | 24 ඒ | පොල්අතුපලාත | 2 | 2 | 1.5 | 1 | 0.75 | 4.5 | 20 | 4 |
| 23 | 24 බී | කටුවිල | 0.5 | 0.5 | 0.25 | 0.15 | 0.75 | 0.5 | 1 | 0.5 |
| 24 | 24 සී | බෝගහපිටිය | 0.01 | 0.5 | 0.01 | 0 | 0 | 0.5 | 0.5 | 0.5 |
| 25 | 24 ඩී | පතිරාජපෙදෙස | 0.75 | 0.75 | 0.25 | 0.25 | 0.25 | 5 | 0.16 | 0 |
| 26 | 24 ඊ | පතිරාජගම | 1 | 10 | 5 | 0 | 5 | 0 | 0.1 | 0 |
| 27 | 87 | පරගහතොට | 0 | 0.5 | 0.13 | 0.01 | 0.006 | 0.13 | 0.13 | 0.06 |
| 28 | 87 ඒ | වතුගෙදර දකුණ | 0.01 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 29 | 87 සී | වතුගෙදර | 0.03 | 0.06 | 0.01 | 0.01 | 0.01 | 0.01 | 0.06 | 0 |
| 30 | 87 ඩී | සීනිගොඩ | 0.03 | 0.03 | 0.03 | 0.03 | 0.01 | 0.01 | 0.03 | 0 |
| 31 | 87 ඊ | වඩුමුල්ල | 0 | 0.06 | 0.0125 | 0 | 0 | 0.16 | 0.31 | 0.031 |
| 32 | 87 එෆ් | කුරුඳුවත්ත | 0 | 0.03125 | 0.125 | 0 | 0 | 0.16 | 0.13 | 0.031 |
| 33 | 87 ජී | විහාරගොඩ | 0.04 | 0.01 | 0.01 | 0.01 | 0.03 | 0.25 | 0.03 | 0.02 |
| 34 | 88 | රන්දොඹේ දකුණ | 0.15 | 0.1 | 0.03 | 0.01 | 0.02 | 0.5 | 0.09 | 0.03 |
| 35 | 88 ඒ | කන්දෙගොඩ | 0.075 | 0.05 | 0.03 | 0.02 | 0.04 | 0.01 | 0.09 | 0.03 |
| 36 | 88 බී | රන්දොඹේ උතුර | 0.09 | 0.075 | 0.01 | 0.01 | 0.01 | 0.375 | 0.075 | 0.01 |
| 37 | 88 සී | බෝගහවත්ත | 0.03 | 0.01 | 0.02 | 0.01 | 0.01 | 0.01 | 0.03 | 0.01 |
| 38 | 89 | බළපිටිය | 0.19 | 0.15 | 0 | 0.06 | 0 | 0.06 | 0 | 0 |
| 39 | 89 ඒ | වලගෙදර | 0.6 | 0.5 | 0.6 | 0.5 | 1 | 2 | 1.5 | 0 |
| 40 | 89 බී | බේරතුඩුව | 0.12 | 0.06 | 0 | 0 | 0 | 0.03 | 0 | 0 |
| **එකතුව** | | | **25.50** | **38.17** | **22.58** | **5.75** | **15.67** | **31.00** | **58.93** | **29.34** |

සංඛ්‍යා සටහන 8.7

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

### 1.7.1. වාණිජ මට්ටමින් එළවළු හා අල බෝග වගා කළ අයගේ තොරතුරු

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | නම | එළවළු වර්ගය | අක්කර ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | පී.මානෙල් එම්.පී. කුලතුංග, සුනිල් | මැකරල්, බණ්ඩක්කා, කරවිල | **2** |
| 2 | 16 | නාපේ | ඩී. කසුන් මාධව මෙන්ඩිස් | පිපිඤ්ඤා,බණ්ඩක්කා | **0.025** |
| 3 | 16 බී | වතුරවෙල | ඕ. කේ. ප්‍රියන්ත | ඉන්නල | **2** |
| 4 | 16 සී | බොරළුකැටිය | K.S. ගුණසේකර | පිපිඤ්ඤා, වැටකොළු | **1.5** |
| | | | S.H.රම්‍යලතා | වැටකොළු | **0.5** |
| | | | D.P.විජේසේකර | වැටකොළු | **0.5** |
| 5 | 17 | හැගල්ල පියගම | එල්. කුමුදු කුමාර | ගෝවා, බණ්ඩක්කා, වෙනත් | **0.5** |
| 6 | 17 බී | මහපිටිය | ජී. රම්‍යසිරි ද සොයිසා | බණ්ඩක්කා, වම්බටු, අමුමිරිස් | **2** |
| 7 | 17 සී | කුඩාගොඩගම | අජන්ත කුමාර | බණ්ඩක්කා, මැකරල් | **0.25** |
| 8 | 17 ඩී | ගොඩපිටිය | වන්න තාබ්‍රෙව් | අමුමිරිස්, වම්බටු | **0.5** |
| 9 | 20 ඒ | පාතෙගම්ගොඩ | ටි. තිලකා ද සිල්වා | මැ, බණ්ඩක්කා, කරවිල, පතෝල, කිරිඅල | **0.75** |
| 10 | 24 බී | කටුවිල | එන්. ජයසිරි ද සිල්වා , පී සිරිල්, සුනිල් ශාන්ත, සුසන්ත කරුණාරත්න | බණ්ඩක්කා, පිපිඤ්ඤා, ලීමා, පතෝල, වම්බටු | **2** |
| **එකතුව** | | | | | **12.53** |

සංඛ්‍යා සටහන 8.8

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

## 1.8. “ පලතුරු ” වගාව (අක්කරවලින්)

අඹ, කෙසෙල්, ගස්ලබු හා රඹුටන් සඳහා ඉතා ම සුදුසු පරිසරයක් සහ කාලගුණික තත්ත්වයක් පවතින නමුත් ගොවීන් පළතුරු සඳහා යොමුවීමේ අඩු ප්‍රවණතාවක් පවති. මිශ්‍ර බෝග වගාවක් ලෙස හෝ පළතුරු වගාව වැඩිදියුණු කිරීමට ගොවීන් දැනුවත් කිරීම වැදගත් වේ. උදාහරණ ලෙස කෙසෙල් වගාවේ යටි වගාවක් ලෙස අන්නාසි වගාව ද කෝපි වගාව සමඟ වැල් දොඩම් වගාව ද යෙදීමෙන් භූමිය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනිමට හැකි බව ගොවීන් දැනුවත් කල යුතුය.

කොට්ඨාසය තුල පලතුරු වගාවන් සිදු කර ඇති ආකාරය පහත 8.9 වගුව අධ්‍යයනයෙන් හඳුනාගත හැක.

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | කෙසෙල් | අඹ | පැපොල් | අන්නාසි | රඹුටන් | දොඩම් | වැල් දොඩම් | දෙළුම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2 | 16 | නාපේ | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 3 | 16 ඒ | පැලැගස්පලාත | 5.2 | 4.1 | 3.2 | 0.19 | 1.1 | 1.3 | 0.19 | 0.09 |
| 4 | 16 බී | වතුරවෙල | 6 | 3 | 1 | 0 | 1 | 0.5 | 0.13 | 0 |
| 5 | 16 සී | බොරළුකැටිය | 11 | 2 | 2 | 0 | 2 | 1 | 0.13 | 0 |
| 6 | 16 ඩී | නානතොටපලාත | 15 | 4 | 4 | 1 | 2 | 3 | 1 | 0.25 |
| 7 | 17 | හැගල්ල පියගම | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 8 | 17 ඒ | කොස්ගොඩ | 3.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | කෙසෙල් | අඹ | පැපොල් | අන්නාසි | රඹුටන් | දොඩම් | වැල් දොඩම් | දෙළුම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 9 | 17 බී | මහපිටිය | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 10 | 17 සී | කුඩාගොඩගම | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11 | 17 ඩී | ගොඩපිටිය | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12 | 18 | අහුන්ගල්ල | 1 | 0.5 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 13 | 18 ඒ | මිද්දරමුල්ල | 3 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 0 |
| 14 | 19 | වැල්ලබඩ | 0.25 | 0.13 | 0.09 | 0.01 | 0.01 | 0.02 | 0 | 0 |
| 15 | 19 ඒ | වතුරෙගම | 6 | 10 | 0.5 | 10 | 20 | 0.5 | 0.25 | 0.25 |
| 16 | 19 බී | මාකුඹුර | 8 | 10 | 0.38 | 0 | 0.06 | 0.5 | 0.12 | 0.5 |
| 17 | 19 සී | කදිරගොන්න | 7 | 5 | 0.19 | 0 | 0.03 | 0.125 | 0.03 | 0.06 |
| 18 | 20 | බ්‍රාහ්මණවත්ත උතුර | 7 | 5 | 0.5 | 0 | 0.02 | 0.5 | 0.5 | 0.25 |
| 19 | 20 ඒ | පාතෙගම්ගොඩ | 0.28 | 0.25 | 0.13 | 0.16 | 0.03 | 0.03 | 0.03 | 0.03 |
| 20 | 20 බී | බ්‍රාහ්මණවත්ත දකුණ | 6 | 4 | 0.4 | 0 | 0.01 | 0.4 | 0.3 | 0.25 |
| 21 | 21 | ගල්මංගොඩ | 0.06 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22 | 21 ඒ | වැලිවතුගොඩ | 0.22 | 30 | 0.19 | 0.13 | 0.03 | 0.03 | 0.03 | 0.03 |
| 23 | 21 බී | හීනටිය උතුර | 0.19 | 2 | 0.5 | 0.03 | 0.006 | 0.06 | 0 | 0 |
| 24 | 21 සී | හීනටිය දකුණ | 0.25 | 1 | 0.18 | 0.09 | 0.5 | 0 | 0 | 0 |
| 25 | 21 ඩී | මහලදූව | 0.5 | 1 | 0.19 | 0.031 | 1 | 0.06 | 0 | 0 |
| 29 | 24 | ගල්වෙහෙර | 0.8 | 0.8 | 4 | 0 | 0 | 0 | 0.1 | 0 |
| 30 | 24 ඒ | පොල්අතුපලාත | 5.5 | 7 | 2 | 5 | 2.5 | 2.5 | 0.06 | 0.03 |
| 31 | 24 බී | කටුවිල | 2 | 3 | 0.4 | 0.8 | 0.4. | 0.4 | 0.4 | 0.4 |
| 32 | 24 සී | බෝගහපිටිය | 2 | 2 | 0.5 | 0.25 | 0.25 | 0.5 | 0 | 0 |
| 33 | 24 ඩී | පතිරාජපෙදෙස | 4.5 | 10 | 1.25 | 0.5 | 2.25 | 0.5 | 0 | 0 |
| 34 | 24 ඊ | පතිරාජගම | 0.8 | 0.4 | 0.4 | 0 | 0.4 | 0 | 0.1 | 0.1 |
| 35 | 87 | පරගහතොට | 3 | 10 | 1 | 0 | 0.5 | 0.25 | 0 | 0 |
| 36 | 87 ඒ | වතුගෙදර දකුණ | 2 | 2 | 0.25 | 0.01 | 0.25 | 0.25 | 0.006 | 0.006 |
| 38 | 87 සී | වතුගෙදර | 4 | 5 | 0.5 | 0.018 | 0.5 | 0.25 | 0.025 | 0.019 |
| 39 | 87 ඩී | සීනිගොඩ | 0.25 | 13 | 2 | 0.25 | 0.75 | 0.25 | 0.25 | 0.25 |
| 40 | 87 ඊ | වඩුමුල්ල | 3 | 6 | 0.5 | 0 | 0.5 | 0.25 | 0 | 0 |
| 41 | 87 එෆ් | කුරුඳුවත්ත | 3 | 8 | 0.5 | 0 | 0.5 | 0.25 | 0 | 0 |
| 49 | 89 ඒ | වලගෙදර | 8 | 7 | 1 | 0 | 0.52 | 0.25 | 0 | 0.02 |
| 51 | 90 | වඳදූව | 0.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 52 | 90 ඒ | මහකරාව | 0.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | | | **133.29** | **157.16** | **30.74** | **18.47** | **36.72** | **13.68** | **3.65** | **2.54** |

සංඛ්‍යා සටහන 8.9

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

### 8.8.1. වාණිජ මට්ටමින් පලතුරු වගා කළ අයගේ තොරතුරු

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | නම | පලතුරු වර්ගය | අක්කර ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | 16 | නාපේ | ඒ.ඩී.ඩබ්.කේ. ජයතිලක | පේර | 0.2 |
| 2 | 17 ඩී | ගොඩපිටිය | චන්න තාබ්‍රෙව් | පේර, දොඩම් | 0.25 |
| 3 | 24 බී | කටුවිල | එච්.ඩී.ද සිල්වා | අඹ | 3 |
| එකතුව | | | | | 3.45 |

සංඛ්‍යා සටහන 8.10

මූලාශ්‍රය: කෘෂි කාර්මික පැතිකඩ - 2025

## 1.9. සත්ත්ව නිෂ්පාදන තොරතුරු

පවුල්වල පෝෂණ මට්ටම ඉහළ නැංවීම, ස්වයං රැකියා අවස්ථා සැලසීම, පවුලේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා පවුල් සඳහා අමතර ආදායම් මාර්ග බිහි කිරීම පෙරදැඩි කරගෙන කෘෂි ගොවිපලවල් කිහිපයක්ම බළපිටිය කොට්ඨාසයේ ඇති අතර 2025 වර්ෂය තුළ එළ ගවයින් 176ක් ද, මී ගවයින් 105ක් ද, එළුවන් 30ක් ද, කිකිළියන් 1, 339ක් ද, කුකුළන් 4, 742 ද වශයෙන් ඇති කරන ලදි. (සංඛ්‍යා සටහන 8.11)

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | එළ ගව | මී ගව | කිකිළියන් (බිත්තර සඳහා) | කුකුළන් (මස් සඳහා) | එළුවන් | ඌරන් |
